සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

## ක්‍රිස්තු ධර්මය

09 ශ්‍රේණිය — කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මැවිල්ලේ භාරකරු වන්නේ,
    (1) මිනිසා ය. (2) දෙවියන් වහන්සේ ය.
    (3) සියලු ලෝක සත්වයා ය. (4) ජේසුස් වහන්සේ ය.

02. ඊශ්‍රායෙල් ජනයාගේ ප්‍රථම රජ බවට පත් වූයේ,
    (1) දාවිත් ය. (2) සලමොන් ය. (3) සාවුල් ය. (4) සැමුවෙල් ය.

03. ස්වාමින් වහන්සේගේ යාච්ඤාව තුළින් අපට උගන්වන්නේ,
    (1) සෑම දෙයක්ම දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ගත යුතු බවයි.
    (2) සෑම විටම තමා ගැන යාච්ඤා කිරීමට ය. (3) ස්තුතිවන්ත වෙමින් යාච්ඤා කිරීමට ය.
    (4) අර්ථවත්ව ඇදහිල්ලෙන් යාච්ඤා කිරීමට ය.

04. සෑම ගැටලු අවස්ථාවකදී ම ස්වාමින් වහන්සේ සමඟ සිටීමෙන් පෙර තත්ත්වයට වඩා හොඳ තත්ත්වයට අපව ගෙන යන බව පෙන්වා දෙන ප්‍රාතිහාර්ය වන්නේ,
    (1) භාරදහසකට කෑම දීම ප්‍රාතිහාර්ය යි. (2) කොරෙකු සුවපත් කිරීමේ ප්‍රාතිහාර්ය යි.
    (3) වතුර මිදි යුෂ කිරීමේ ප්‍රාතිහාර්ය යි.
    (4) රාජ්‍ය නිළධාරියාගේ පුත්‍රයා සුවපත් කිරීමේ ප්‍රාතිහාර්ය යි.

05. ජේසුස් වහන්සේ විසින් සබත් දිනයේ දී සුව කරන ලද්දේ,
    (1) අංසභාග රෝගියෙකි. (2) කොර වූ රෝගියෙකි.
    (3) උණ රෝගයෙන් මරණාසන්න වූ රෝගියෙකි. (4) අතක් පණ නැති රෝගියෙකි.

06. දැනුම හා ඥානය පහළ වන්නේ සමිඳුන්ගේ මුවිනි. සමිඳාණෝ අවංක වූවන්ට නියම ................ දෙන සේක.
    (1) සත්‍යවාදීකම (2) රැකවල් (3) ප්‍රීතිය (4) ප්‍රඥාව

07. ජේසුස් වහන්සේ වෙතින් තම පුත්‍රයාගේ සුවය බලාපොරොත්තු වූ රාජ්‍ය නළධාරියා තුළ වූ විශේෂ ගුණාංගය වූයේ,
    (1) බලාපොරොත්තුව හා විශ්වාසයයි. (2) විශ්වාසය හා ඇදහිල්ලයි.
    (3) අවංකකම හා කැපවීමයි. (4) කැපවීම හා බලාපොරොත්තුවයි.

08. දේව වචනයට අනුව මිනිසා සමෘද්ධිමත් වන්නේ,
    (1) හිතා මතා ක්‍රියාශීලීව වැඩ කිරීමෙනි. (2) ක්‍රියාශීලීව උපයාගත් දේ සකසුරුවම්ව භාවිතයෙනි.
    (3) තමන් ගැන සිතා කාර්යක්ෂමව වැඩ කිරීමෙනි. (4) වෙහෙස නොවී මුදල් ඉපයීමෙනි.

09. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව සනාථ කරමින් දමස්කයේ ධර්මශාලාවේ දේශනා කළේ,

(1) පේදුරු තුමාය. (2) ජොහාන්තුමාය. (3) පාවුල් තුමාය. (4) ස්තේපන් තුමාය.

10. 'විවාහය සියල්ලන් අතර ගෞරවනීයවද, විවාහ බැම්ම නොකැලැල්ව ද පවතීවා.' මෙසේ සඳහන් වන ශුද්ධ බයිබලයේ ඇති ලිපිය වන්නේ,

(1) කොරින්ති ලිපිය. (2) එපීස ලිපිය. (3) හෙබ්‍රෙව් ලිපිය (4) ගලාති ලිපිය

11. මුල් කිතුණු සභාව තුළ දක්නට ලැබුණු ලක්ෂණයක් නොවන්නේ,

(1) රොටී කැඩීම. (2) සුබ අස්න දේශනා කිරීම.

(3) ගෙයින් ගෙට ගොස් යාච්ඤා කිරීම. (4) සුබාරංචිය ග්‍රන්ථාරූඪ කිරීම.

12. නව යොවුන්වියේ සිටින ඔබ විමසිලිමත් විය යුත්තේ,

(1) ඔබට රිසිසේ රිසිපරිදි කිරීමට ය. (2) දෙමාපියන් කැමති දේ කිරීමට ය.

(3) සමාජයට කැමති දේ කිරීමට ය. (4) දේව කැමැත්තට අනුකූල දේ කිරීමට ය.

13. 'මාගේ පුත්‍රය විචක්ෂණ බුද්ධියද, තීක්‍ෂණ ඥානයද දියුණු කර ගන්න.' මෙසේ සඳහන් වන්නේ ශුද්ධ බයිබලයේ,

(1) හිතෝපදේශ පොතෙහි ය. (2) ධර්මදේශකයා පොතෙහි ය.

(3) ගීතාවලීය පොතෙහි ය. (4) එපීස පොතෙහි ය.

14. ප්‍රේරිතවරුන්ට නිර්භීතව බලවත්ව අරුම පුදුම දේවල් කරන්නට ශක්තිය ලබා දෙන්නේ,

(1) දෙවියන් වහන්සේ ය. (2) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.

(3) ජේසුස් වහන්සේ ය. (4) නායක පූජකයන් ය.

15. සබත ශුද්ධ ලෙස පවත්වන කිතුණුවාගෙන් ජේසු තුමන් බලාපොරොත්තු වන්නේ,

(1) සබත් දවසේ දේව වචනය මෙනෙහි කිරීමයි. (2) සෑම සබත් දිනයකම දේවස්ථානයට යෑමයි.

(3) සබත් දිනය යහපත උදෙසා යෙදවීමයි. (4) සබත් දිනය ලෙඩුන් උදෙසා වෙන් කිරීමයි.

16. 'විපත්ති දවස් පැමිණෙන්නට පෙර ඔබේ යෞවුන් වියේදී ඔබේ මැවුකාර දෙවියන් වහන්සේ සිහි කරන්න.' මෙලෙස සඳහන් වන ශුද්ධ බයිබලයට අයත් පොත වන්නේ,

(1) හිතෝපදේශය (2) ධර්මදේශකයා (3) 1 කොරින්ති (4) ගලාති

17. කිතුණු සභාව වැනසීමේ ව්‍යාපාරය තදින්ම ක්‍රියාත්මක වන සමයේ ගෙයින් ගෙට ගොස් කිතුණු පුරුෂයන් හා ස්ත්‍රීන් අත්අඩංගුවට ගැනීමට මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,

(1) පේදුරු ය. (2) සාවුල් ය. (3) ස්තේපන් ය. (4) පිලිප් ය.

18. A - ජේසුස් වහන්සේ ඔහුට සම්මුඛ විය. B - උන්වහන්සේගේ හඬ ඔහුට ඇසිනි.

C - ඔහුගේ සෙවනැල්ල පවා රෝගීන් පිට වැටුන විට සුවවිය.

D - උන්වහන්සේගේ ආලෝකනය ඔහු අත්දැක්කේ ය.

ඉහත ප්‍රකාශන අතුරින් පාවුළුතුමා සම්බන්ධ ප්‍රකාශන පමණක් ඇති පිළිතුර තෝරන්න.

(1) AB හා D (2) AB හා C (3) BC හා D (4) AC හා D

19. ජේසුස් වහන්සේගේ ජීවිත පූජාවෙන් අපවෙත පැවරෙන මෙහෙවර වන්නේ,

(1) ලෝකයා විනිශ්චය කිරීමය. (2) හැම විටම සුබාරංචියට සාක්ෂි දැරීමය.

(3) හැකි හැමවිටම දේවස්ථානයට යෑමය. (4) නින්දා අපහාස විඳදරා ගැනීමය.

20. A - ඔබගේ රාජ්‍ය පැමිණේවා. B - මාගේ වරදට මට කමා වුව මැනව.

C - ඔබ වහන්සේගේ කැමැත්ත වේවා. D - අපගේ දවස්පතා ආහාරය අද අපට දුන මැනව.

ඉහත වගන්ති අතුරින් ස්වාමින් වහන්සේගේ යාච්ඤාව හා සම්බන්ධ වගන්ති ඇතුළත් පිළිතුර වන්නේ,

(1) AB හා C (2) AC හා D (3) AB හා D (4) BC හා D

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) දෙවියන් වහන්සේ මැවිල්ලේ මුදුන් මල්කඩ වන මිනිසා මවන ලද්දේ කුමන ආකාරයටද?
(ii) නෝවාගේ දරුවන් දෙදෙනෙක් නම් කරන්න.
(iii) ශුද්ධ බයිබලයේ අඛණ්ඩව දිවෙන තේමාව කුමක්ද?
(iv) ඔවුහු ද කා තෘප්තියට පැමිණියහ. ඉතිරි වූ කැබලි එක්කොට කූඩා හතක් පුරවා ගත්හ. ඉහත බයිබල් කොටස හා සම්බන්ධ ජේසුන් වහන්සේ විසින් සිදුකරන ලද ප්‍රාතිහාර්ය කුමක්ද? එහි වූ ආහාර ප්‍රමාණයන් කොපමණද?
(v) ජේසුස් වහන්සේ විසින් ධර්මශාලාවේදී සුවකරන ලද්දේ කුමන රෝගියෙක්ද?
(vi) සබත් දිනයේදී යම් කාර්යයක නිරත වීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ලිඛිතව සඳහන්ව තිබුනේ කොහේද?
(vii) ජේසුස් වහන්සේ විසින් සිදුකරන ලද ප්‍රථම ප්‍රාතිහාර්ය කුමක්ද? එය සිදු කරන ලද්දේ කොහේදීද?
(viii) පේදුරු තුමා විසින් මළවුන්ගෙන් නැගිටුවනු ලැබී කාන්තාව කවුද? ඇය හඳුන්වනු ලැබූ වෙනත් නමක්ද සඳහන් කරන්න. (ල. 2x8=16)

02. (i) අපෝස්තුළුවරු විසින් සිදු කරන ලද ප්‍රථම ප්‍රාතිහාර්ය කුමක්ද? එය සිදුකරන ලද්දෙ කොහේදීද? (ල. 02)
(ii) ශුද්ධාත්ම දානය අත්දුටු ප්‍රේරිතවරුන් උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරූ ආකාර 03 ක් ලියා දක්වන්න. (ල. 03)
(iii) "පොළොවේ සීමාන්තය දක්වා මාගේ සාක්ෂිකරුවන් වන්න." යන බයිබල් පාඨයට අනුව කිතුණු ඔබට ක්‍රියා කළ හැකි ආකාර 3 ක් ලියන්න. (ල. 06)

03. (i) ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් ජීවිත පූජාකරමින් සභාවේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියා කළ අය හඳුන්වන්නේ කුමන නමකින්ද? (ල. 02)
(ii) ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ සවිමත් වූ මුල් කිතුණු සභාව මුහුණු දුන් පීඩා 03 ක් ලියා දක්වන්න. (ල. 03)
(iii) ස්තේපන් තුමාගේ ජීවිතයෙන් කිතුණු අපගේ ජීවිතයට ගතහැකි ආදර්ශ 03 ක් ලියන්න. (ල. 06)

04. (i) සදාචාරාත්මක යහපත් ජීවිත පැවැත්මක් ගත කිරීම සඳහා උපදෙස් ලබාදෙන ශුද්ධ බයිබලයේ පොත් දෙකක් නම් කරන්න. (ල. 02)
(ii) දේව රාජ්‍යයේ ගෞරවය උදෙසා තරුණවියේදී ඔබට කළහැකි දේවල් 03 ක් ලියන්න. (ල. 03)
(iii) ගලාති 5:19-21 ට අනුව මාංසික තෘෂ්ණා 06 ක් නම් කරන්න. (ල. 06

05. (i) සන්නිවේදන තාක්ෂණයේ නව මංපෙත් දෙකක් නම් කරන්න. (ල. 02)
(ii) නව තාක්ෂණය දේව සේවය උදෙසා යොදාගත හැකි අවස්ථා 03 ක් ලියන්න. (ල. 03)
(iii) නව තාක්ෂණය හා දේව අභිමතය යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් ලියන්න. (ල. 06)

06. (i) 1 කොරෙන්ති 6:19-20 බයිබල් පාඨයට අනුව පාවුල් තුමා අපගේ ශරීර සමාන කරන්නේ කුමකටද? (ල. 02)
(ii) අපගේ ශරීරය වෙනුවෙන් අපට ඇති වගකීම් 03 ක් ලියන්න. (ල. 03)
(iii) කිතුණු පවුලක විශ්වාසය බිඳියාම නිසා පැන නගින ගැටළු සහගත තත්ත්වයන් හයක් ලියා දක්වන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 )  02. ( 3 )  03. ( 4 )  04. ( 3 )  05. ( 4 )  06. ( 4 )  07. ( 2 )  08. ( 1 )  09. ( 3 )  10. ( 1 )
11. ( 4 )  12. ( 1 )  13. ( 1 )  14. ( 2 )  15. ( 3 )  16. ( 2 )  17. ( 2 )  18. ( 1 )  19. ( 2 )  20. ( 2 )

## II කොටස

01. (i) දේව ස්වරූපටය (දෙවියන් වහන්සේගේ ස්වරූපයට)

(ii) ෂෙම්, හාම්, ජපෙත්

(iii) ප්‍රේමය.

(iv) ♦ හරදහකසට කැමදීම. ♦ රොටි හතක් සහ කුඩා මසුන් සුවල්පයක්

(v) අතක් පණනැති මිනිසෙක්

(vi) ජුදෙව් ව්‍යවස්ථාවේ

(vii) ♦ වතුර මිදි යුෂ කිරීමේ ප්‍රාතිහාර්යය. ♦ කානාහිදී

(viii) දොර්තස් / තබීනා / මුවදෙන (ල. 2x8=16)

02. (i) ♦ කොර වූ මිනිසෙකු සුව කිරීම. ♦ සුදර්ශන දොරවටුව අසලදී. (ල. 02)

(ii) දේශනා කිරීම, ක්‍රිස්තුස් වහන්සේගේ නැමයෙන් බෞතිස්ම කිරීම, ලෙඩුන් සුවකිරීම. (ල. 03)

(iii) සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (i) වේද සාකෂිකයන් (ල. 02)

(ii) ♦ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම තහහනම් කිරීම. ♦ සාක්ෂි දරන පුද්ගලයන් සිරභාරයට ගැනීම. ♦ කිතුණුවන් ජුදා ව්‍යවස්ථාවට බාධා කරන්නන් ලෙස සැලකීම. (පෙළ පොත පිටු අංක 39) (ල. 03)

(iii) ♦ දේව කැමැත්ත හඳුනාගෙන එය ජීවිතයට අදාළකර ගැනීම. ♦ ඕනෑම අවස්ථාවක නිර්භීතව සාක්ෂි දැරීම. ♦ පීඩාකාරී අවස්ථාවලදී යාච්ඤා කිරීම. ♦ සතුරන්ට සමාව දීම. (පෙළ පොත පිටු අංක 43) (ල. 06)

04. (i) හිතෝපදේශ, ධර්මදේශකයා, ගලාති, එපීස, කොරින්ති, හෙබ්‍රෙව්. (ල. 02)

(ii) ♦ දේව රාජ්‍යයේ මෙහෙවර උදෙසා තම ශ්‍රමය, කාලය, ධනය, බුද්ධිය මෙහෙය වීම. ♦ අප කරන සෑම දෙයක්ම දේව කැමැත්තට අනුව කිරීම. ♦ අපගේ ක්‍රියාව, කතාව, සිතිවිලි හැමවිට යහපත් වීම. ♦ අප ගන්නා තීරණ දෙවියන් වහන්සේ ගෞරවයට පත්වන ආකාරයට ගැනීම. (සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.) (ල. 03)

(iii) බීමත්කම, අපවිත්‍රකම, සල්ලාලකම, කාමමිත්‍යාචාරය, වෛරය, සුරාධූර්ත උත්සව, යසස්නාමය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව. (පෙළ පොත පිටු අංක 46) (ල. 06

05. (i) රූපවාහිනිය, ජංගම දුරකථනය, අන්තර්ජාලය, මුහුණු පොත (face book) (ල. 02)

(ii) සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii) සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය (ල. 02)

(ii) එය ආරක්ෂා කර ගැනීම, එය පිරිසිදුව තබා ගැනීම, එයට ගෞරව කිරීම, එය විනාශ නොකිරීම. (ල. 03)

(iii) පවුල් ආරවුල්, පවුල් සංස්ථා බිඳී යාම්, දරුවන් අසරණ වීම, පවුලේ පිරිහීම වේගවත් වේ. දේව විනිශ්වයට ලක් වේ. (ල. 06)